මොනවා කියන්න ද?'' ඈ අවසානයේ හිත හදා ගත්තා ය.

දිලීප රෝහලට එන විට සවස පහ පසු වී තිබුණි. ඒ වන විට නිෂාධි පිබිදී සිටියා ය. ඔහු කාමරයේ දොරින් ඇතුල් වත්ම නිෂාධි දෑස් වසා ගත්තා ය. ඔහුට මුහුණ දී ගත නොහැකි බවක් ඇයට දැනුණි. මේ අවස්ථාවට මුහුණ දෙන්නට ඈ කල්

*ඔහු ජනේලයට එපිටින් පෙනෙන ජනාකීර්ණ මං මාවත් දෙස අරමුණකින් තොර ව බලා සිටියේ ය. තමා රට හැර ගියායින් පසුව කොයි කරම් මේ පරිසරය වෙනස් වී තිබේ ද?*

ඇතිවම සිත හදාගෙන සිටිය ද කෙළින් ඔහුගේ මුහුණ බලන්නට නොහැකියාවක් මේ මොහොතේ දී ඇයට තදින් දැනුණි.

ඔහු පැමිණි වහාම ඇගේ අතින් අල්ලා ගත්තේ ය. ඈ වහා සිය අත ආපස්සට ඇද ගත්තා ය.

''නිෂා. .'' ඔහු පහත් හඬින් ඈ ඇමතුවේ ය. ''දැන් කොහොම ද?'' ඔහු ඇසුවේ ය.

''මොකද වුණේ?'' යයි නොඇසීම ඇයට මහත් සහනයක් විය.

නිෂාධි කිසිවක් නොකියා දෑස් පියාගත්වන ම සිටියා ය. දිලීප ඇඳ අසළ වූ පුටුවක වාඩි වී සිය බිරිඳගේ මුහුණ දෙස බලා සිටියේ ය..

''දිලීප මෙතන ඉන්න නිසා අපි එළියට ගිහින් එන්නම්..'' පවිත්‍රා කීවා ය. හැකි ඉක්මනින් මෙතැනින් පිටව යාම නුවණට හුරු ය. දිලීප හිස සළා අනුමැතිය දුන්නේ ය.

බොහෝ වේලාවකට පසු නිෂාධි දෑස් හැර බලන විට දිලීප තවමත් තමා දෙස බලා සිටිනු දුටුවා ය.

''හුඟක් අමාරුද නිෂා..?'' ඔහු පහත් හඬින් ඇසුවේ ය.

ඈ කිසිවක් නොකීවා ය.

''අපි ඉක්මණට ඔස්ට්‍රේලියාවට යමු..'' ඔහු දෙවෙනුව කීවේ ය. ''..මම ඩොක්ටර්ස්ල එක්ක කතා කරන්නම්..''

නිෂාධි යමක් කියනු ඇතැයි යන බලා පොරොත්තුවෙන් ඔහු කතාව නවතා ඇය දෙස බලා සිටියේ ය.

''ම.. ට බැ.. හැ..'' ඈ බොහෝ වේලාවකට පසු මුරණ්ඩු ලෙස කීවා ය. ''ම.. ම.. ආ.. යෙ එ.. න්.. නෙ.. නැ.. හැ..''

''පිස්සු ද ඔයා ට?''
''නැහැ''

''ඔයාට තාම සනීප මදි.. අපි පස්සෙ කතා කරමු.. ..'' දිලීප පුටුවෙන් නැගී සිට කාමරයේ ජනේලය අසළට යමින් කීවේ ය. ඔහු ජනේලයට එපිටින් පෙනෙන ජනාකීර්ණ මං මාවත් දෙස අරමුණකින් තොර ව බලා සිටියේ ය. තමා රට හැර ගියායින් පසුව කොයි කරම් මේ පරිසරය වෙනස් වී තිබේ ද? ඔහු ආපසු හැරී නිෂාධි දෙස බැලුවේ ය. ඇය දෑස් පියාගෙන සිටියි. සමහර විට නින්ද යන්නට ඇත.

නිෂාධි වෙනස් වී සිටිතැයි දිලීපට සිතෙයි. එය ඔහුට දැනෙයි. එය එසේ විය හැකි ද?

නිෂාධි හා ගෙවූ දිවිය දෙස ආපසු හැරී බලන්නට දිලීප වෙහෙසුණෝ ය. අධික ලෙස වෙහෙසී අධ්‍යයන කටයුතු වල යෙදෙන තමාගේ ජීවිතයේ එක් පසෙකින්

24 පිටට





